රඹුක්කන ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්තය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූනි 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ පුස්තකාල පොත්වලට අදාල රු. 40,918 ක ලද වට්ටම් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබුණු වට්ටම් ගිණුමගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන අතර , මින් ඉදිරියට මෙවන් වැරදි සිදුනොවීමට වගබලා ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නංවාලීම සඳහා කර්මාන්ත 44 ක් වෙනුවෙන් විවිධ අරමුදල් ප්‍රභවයන්ගෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ආධාර රු.15,255,295 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධන ආධාර ගිණුම්ගත කළ යුතුවේ. | අදාල කර්මාන්ත සඳහා ප්‍රාග්ධන ආධාර ලැබුනේ වෙනත් ආයතනයකට වූ බැවින් ගිණුම්වලට ඇතුලත් නොකරන ලදී. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.1,940,000 ක් වැයකර රඹුක්කන පොල භූමියේ ඉදිකර තිබූ ළමා උද්‍යානය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සභාව සතු දේපල ගිණුම්ගත කළ යුතුවේ. | පිළිතුරු දී නැත. |

| | | | |
|---|---|---|---|
| (Iv) | සභාව සතු ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු පොලී රු. 827,043 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | එක් එක් ස්ථාවර තැන්පතු කල්පිරෙන දින අනුව පොලිය අතපසුවීමකින් ගණනය කර නොමැති අතර, මෙම වෙනස 2019/12/31 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ව්‍යාපෘති තුනක් සඳහා ලබාගෙන තිබූ ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවියයුතු ණය ශේෂය රු.14,293,029 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගෙවිය යුතු වියදම් මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු වේ. | දේශීය ණය සංවර්ධන අරමුදලින් ව්‍යාපෘති තුනක් සඳහා ලබා ගත් ණය .ණය ලබා දුන් අවස්ථාවලදී ගිණුම් ගත කිරීමේ දෝෂයක් බැවින් තවදුරටත් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06 ක ශේෂයන් හා අදාල උපයෝගී ලේඛන /වාර්තාවල ශේෂයන් අතර රු.8,663,767 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීමට අදාල ලේඛන /වාර්තා තවදුරටත් පරික්ෂා කර වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු ගෙවිය යුතු ගිණුම්

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂය ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.266,200 ක් විය. | අයකර ගැනීමට කටයුතු කළයුතුය. | ගිණුම්කරණයේ දී සිදු වූ දෝෂයක් නිසා පියවා නොමැති තත්කාර්ය අතුරු අග්‍රිම සභා තීරණයක් අනුව කපා හැරීමට අනුමැතිය ලබා දී ඇත. සංවර්ධන සහා විසුරුවා පළාත් පාලන ආයතනවලට වත්කම් බෙදා හැරීමේදී කෑගල්ල ප්‍රාදේශීය සභාව මගින් රඹුක්කන ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු. 200,000 ක මුදල සම්බන්ධව කෑගල්ල ප්‍රාදේශීය සභාවට සිහිකැඳවීම් යවා ඇතත් ඒ සම්බන්ධව පිළිතුරක් ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂය ඉක්ම වූ ගෙවිය යුතු ණයහිමි වටිනාකම රු. 2,715,577 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂ 01 ක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයේ රු.492,887 ක් විගණන ගාස්තු වන අතර මෙම මුදල මේ වන විට ගෙවා ඇත. ඉතිරිය 2017 වර්ෂයට පෙර සිට පැවත එන දිර්ඝකාලීන ශේෂයක් වන අතර මෙම ශේෂය සොයා බලා ගෙවීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

1.4 අනුකූල නොවීම

--------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>(i) 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආපනශාලා හා නවාතැන්පලවල් සඳහා බලපත්‍ර ගාස්තුව ඒවායේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට එකක් නොඉක්ම විය යුතු වුවත් හඳුනා ගත් ආපනශාලා හා ලැගුම්හල් 03 කින් එලෙස ගාස්තු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | එක් හෝටලයක් සභාවට අයත් නොවන අතර හෝටල් දෙකක් වසා දමා ඇත. එක් හෝටලයක් ගෙවීම් කරන අතර අනෙකුත් හෝටල් ආපන ශාලා හා ලැඟුම්හල් වලින් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| | (ii)158(1)(ආ) වගන්තිය | වර්ෂයකට වැඩි කාලයක සිට නොගෙවූ වරිපනම් බදු රු. 494,451 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නොගෙවූ රු.682,520 ක් වූ වරිපනම් බදු හිඟ මුදලින් දේපල තහනම් කිරීමේ වැඩසටහන් මඟින් රු.188,069 ක් අයකරගෙන ඇති අතර, අයිතිකරුවන් සොයා ගත නොහැකි දේපලද පවතින අතර ඉතිරි මුදල් මෙම වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරන අතර, අයකර ගත නොහැකි මුදල් සම්බන්ධයෙන් නීතිමය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පියවර ගැනිමට කටයුතු කරමි |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 (2)(ඇ) | ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවත් 2004 වර්ෂයේ සිට පැවත එන රු. 53,720 ක් වූ අත්තිකාරම් ගෙවීම් 08 ක් සමාලෝචිත වර්ෂය අවසන්වන විටද පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙතෙක් පියවා නොමැති තත්කාර්ය අතුරු අග්‍රිම සහා තිරණයක් අනුව කපා හැරිමට අනුමැතිය ලබාගෙන ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු 163,922 ක්වූ චෙක්පත් 79 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර එයින් රු.98,650 ක් වූ චෙක්පත් 63 ක් වසර දෙකක කාලයක් ඉක්මවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම චෙක්පත් සම්බන්ධයෙන් අදාල පුද්ගලයන් හා ආයතන ලිඛිතව දැනුවත් කර ඉදිරි කටයුතු කරමි. |
| | (iii) මුදල් රෙගුලාසි 571(2) | 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාල රු. 2,183,602 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කල් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර මේ වන විට රු.1,858,521 ක මුදලක් ආදායමට ගැනිමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන14 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | වාහන දෙකක ඉන්ධන පරීක්ෂාව කඩිනමින් කිරීමට කටයුතු කරන අතර එක් වාහනයක් අළුත්වැඩියා කළ යුතු වේ. රියදුරන්ගේ පවතින පුරප්පාඩු මත අනෙකුත් වාහන දෛනිකව ධාවනයේ නොයෙදෙන |

නිසා ඉන්ධන පරික්ෂාව සිදු කිරීම අපහසු වේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,461,090 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු103,452,041 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,186,286 | 5,697,341 | 5,397,065 | 1,077,221 | 5,953,131 | 6,673,524 | 5,956,228 | 1,422,307 |
| කුලී | 11,912,974 5 | 11,800,805 | 11,322,271 | 1,011,890 | 9,382,345 | 10,007,367 | 9,891,842 | 728,303 |
| බලපත්‍ර ගාස්තු | 4,423,360 | 4,580,776 | 4,497,986 | 82,789 | 3,787,641 | 3,971,182 | 3,966,152 | 5,030 |
| වෙනත් ආදායම් | 25,614,500 | 69,093,287 | 18,272,664 | 52,413,213 | 6,295,500 | 89,661,332 | 89,661,332 | - |

#### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 98,697 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට පවත්නා ශේෂයෙන් 2019 පළමු කාර්තුව තුළ රු.10,773 ක් අය වී ඇති අතර දැනට කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇති මුදල රු.72,116 ක් වේ. ඉතිරි ශේෂය මෙම |

| | | |
|---|---|---|
| | | වර්ෂය තුල අය කර ගැනීමට කටයුතු කරන අතර හිඟ වාර්තා ආදායම් පරීක්ෂකවරුන් වෙත ලබා දීමටද කටයුතු කර ඇත. |

2.2.3 කඩ කාමර කුලී

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කාමර කුලී ශේෂය රු. 866,698 ක් වූ අතර වර්ෂයක කාලයක් ඉක්මවා ඇති අයවිය යුතු ශේෂය රු. 533,356 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟ කඩ කුලී ශේෂය වන රු .1,011,890 න් රු 145,192 ක් 2019 වර්ෂයේ මුල් කාර්තුවේ ලැබී ඇත. ඉතිරි ශේෂයන් රු. 273,496 ක් නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල පවතින අඩුපාඩු මත ව්‍යාපාරික කටයුතු කිරීමට නොහැකිව ඇති බැවින් මුදල් අය නොකරන ලෙස අදාල ව්‍යාපාරිකයන් විසින් ඉල්ලීමක් කර ඇත. අයවිය යුතු සතිපොළ හා කෙසෙල්කන් වෙළඳ පොළ ගාස්තු රු. 557,777 ක ශේෂයෙන් රු. 550,381 ක මුදල වර්ෂයකට වඩා පැරණි ශේෂයක් වන බැවින් එම මුදල, 2018 වර්ෂයට ලැබිය යුතු රු. 27,196 ක මුදල සහ රු. 77,760 ක නැවතුම්පොළ ගාස්තු සඳහාද නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. ඉතිරි හිඟ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 වෙනත් ආදායම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ අවසරයකින් තොරව ප්‍රදර්ශනය කර තිබූ තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරු 118 කින් රු. 45,680 ක් හා ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 03 කින් රු.79,500 ක් අයකර ගෙන නොතිබුණි. | සභාවට ලැබීමට තිබෙන ආදායම් රැස්කර ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කල අතර ඒ අනුව එක් සමාගමක් විසින් ගෙවීම් සිදු කර ඇත. ඉතිරි ස්ථාවර දැන්වීම් පුවරු සඳහාද මුදල් අයකර ගැනීමට කටයුතු කරන අතර, අනවසර ප්‍රචාරක දැන්වීම් පුවරු සියල්ල කපා ඉවත් කිරීමට කටයුතු කරන ලදී. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,614,937 ක් හා මුද්දර ගාස්තු රු.48,797,956 ක් විය. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළයුතුවේ. | 2018 වර්ෂයට උසාවි දඩ රු. 1,834,332 ක් පමණක් ලැබී ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඉටු කිරිමට සැලසුම් කරන ලද කොම්පොස්ට් භූමියේ සේවකයන් සඳහා විවේකාගාරයක් ඉදි කිරිම ඇතුළු යෝජිත සංවර්ධන ව්‍යාපෘති 9 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතීන් සිදු කිරීමට නොහැකි වුයේ 2018 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අවසන් වීම හේතුවෙන් වුවත් සිව්වාර්ෂික සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතීන් ඉදිරි වර්ෂ 02 ක තුල ඉටු කිරීම අපේක්ෂිතයි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| I | සභා බල ප්‍රදේශයේ එකතු වන නොදිරන කසල බැහැර කිරිමට ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පරිසර හානිය අවම වන අයුරින් අපද්‍රව්‍ය කළමනාකරණය | දාහකයක් ඉදිකිරිම සඳහා ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘති වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| | කළයුතුවේ. | කර ඇතත්, අනුමැතිය ලැබී නැත. ඒ සඳහා නැවතත් අවධානය යොමු කරවීමට කටයුතු කරමි. |
| Ii කැලිකසල බැහැර කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු පාරිසරික සහතිකය ලබා ගෙන නොතිබුණි. | කසල බැහැර කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබා ගත යුතුවේ. | පාරිසරක බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 පෙබරවාරි වන විටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළයුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සැලැස්ම කඩිනමින් සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2005 වර්ෂය හා 2014 වර්ෂය අතර කාලය තුළ ස්ථාන මාරුවී ගිය සේවකයන් 07 දෙනකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.155,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරු වී ගිය ආයතනය පිළිබඳ ලිඛිතව දන්වන ලෙස දැනුම් දීම සිදු කළද පිළිතුරක් ලැබී නැත. නැවතත් දැනුවත් කිරීමට කටයුතු කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) I. වරිපනම් සම්බන්ධයෙන් රු. 196,000 ක් වැයකර පරිගණක මෘදුකාංගයක් 2014 වර්ෂයේදී හඳුන්වා දී තිබුණද, එම වැඩසටහන මඟින් නියමිත කාලයට පෙර | ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා විධිමත් නිවැරදි ක්‍රමවේදයක් සකස්කර ගත යුතුවේ. | නියමිත කාලයට පෙර සිදුකරන ඉදිරි ගෙවීම් සහ වට්ටම් නිවැරදිව ගිණුම්ගත වීම සම්බන්ධව ගැටළු පවතින අතර ඒ සම්බන්ධයෙන් ආයතනය ලිඛිතව දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා |

| | | |
|---|---|---|
| සිදුකරන ඉදිරියට ගෙවීම් සහ වට්ටම් නිවැරදිව ගිණුම්ගත කිරීමට නොහැකි වීම හේතුවෙන් එම කටයුතු නැවත අතින් සිදුකිරීම සඳහා අමතර කාලය හා ශ්‍රමය යෙදවීමට සිදුව තිබුණි. | | යොමු කරමි. |
| II. 2017 වර්ෂයේ සිදුකර තිබුණු නව වරිපනම් බදු තක්සේරුව අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂයේදීද සභාව අපොහොසත්වී තිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | නව තක්සේරුව සම්බන්ධ තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර ඒ අනුව 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හැකි වේ. |

(ආ) කඩ කාමර කුලියට දීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රඹුක්කන නව පළමු පොදු වෙළඳ සංකීර්ණය 2017 සැප්තැම්බර් 25 දින විවෘත කර තිබුණද, එහි බිම් මහලේ කඩ කාමර 8 ක් 2019 පෙබරවාරි වනවිටද ඉදිකිරීම් අවසන්කර නොතිබීම හේතුවෙන් නිසි ප්‍රතිලාභ ලබාගැනීමට සභාවට නොහැකිවී තිබුණි. | ඉදිකිරීම් කාර්යක්ෂමව නිමකර කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රඹුක්කන නව පළමු වෙළඳ සංකීරණයේ 2017 සැප්තැම්බර් 25 දින ආරම්භ කළද වැඩ නිමකර නැති බිම් මහලේ කඩ කාමර පැරණි කඩ කාමර හිමියන්ට ලබා දීමට කර තිබූ තීරණය අනුව කඩ හිමියන් එම කඩ ඔවුන්ගේ වියදමින් සකස් කර ගැනීමට ඇති ඉල්ලීමට ඉඩදී ඇත. ඒ අනුව මේ වන විට වැඩ අවසන් වී ඇති අතර මුදල් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ii) | නව දෙවන වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ විවෘත නොකරන ලද හා නිමකර නොමැති කඩ කාමර 17 කින් සියයට 60 බැගින් රු. 14,159,257ක එක්වන් මුදලක් ලබාගෙන තිබුණද 2019 පෙබරවාරි දක්වා නිම කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ඉතිරි එක්වන් මුදල් සහ කඩ කුලී අයකරගැනීමට නොහැකිව තිබුණි. | ඉදිකිරීම් කාර්යයන් නිමකර හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව මාස 06 ක් තුල වැඩ අවසන් කළයුතු නමුත් මේ වන විට මාස 06 ඉක්ම වී ඇති බැවින් 2019.03.07 ලිපිය මඟින් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව මේවන විට වැඩ අවසන් අදියරේ පවතී. |

3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබූ රු.57,059,225 ක් වටිනා වාහන 24 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන 24 පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 20 ක එකතුව වූ රු. 3,080,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා වැය විෂයන් 04 ක එකතුව වූ රු.1,225,000 ක ප්‍රතිපාදන වලින් සියයට 85 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් උපයෝජනයකර නොතිබුණි. | අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය පාලනකාරකයක් ලෙස යොදාගත යුතුවේ. | අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කරමි. |

4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන ගියද, එම වාර්තාවලින් පෙන්වාදෙන අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම මඟින් සභාවේ කටයුතු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වාදෙන අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ රැස්වීම් පවත්වා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරගත යුතුවේ. | 2018 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා 2019.02.12 දින විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත. |

4.4 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ වාර්තාව මඟින් පෙන්වාදී තිබූ පහත සඳහන් අඩුපාඩු සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| | (i) වාහනයක වටිනාකම රු. 37,925 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වෙනස 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| | (ii) ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුළත් සභාවට අයත් අක්කර 02 රූඩ් 2 පර්චස් 9.45 ක ඉඩම් කොටස් 06 ක වටිනාකම ගිණුම්ගත නොකිරිම. | අදාල ඉඩම් හඳුනාගෙන තක්සේරු කර ගිණුම් ගත කළ යුතුවේ. | මෙය 2019 අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන අතර එක් ඉඩමක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට මේ වන විට ඇතුලත් කර එම වටිනාකමද 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| | (iii). ඉඩම් සහ ගොඩනැගිලි ගිණුම්ගත කිරීමේදී වත්කම් වල වටිනාකම රු. 80,146,875 කින් ද්විගණනය වීම. | නිවැරදි කළ යුතුවේ. | අතපසුවීමකින් නිවැරදි කිරීමට නොහැකි වී ඇති අතර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 වර්ෂයේ සිට රඹුක්කන නාගරික සංවර්ධන අධිකාරිය නමින් ජංගම වගකීම් යටතේ දැක්වෙන රු.76,704 ක ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. | හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |